ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2020 ඔක්තෝබර් මස 09 දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2020 අගෝස්තු

## සමස්ත නිරීක්ෂණ

| | 2020 අගෝස්තු | 2020 ජනවාරි - අගෝස්තු |
|---|---|---|
| වෙළඳ හිඟය | එ.ජ.ඩො. මිලියන 342<br>2019 අගෝ. එ.ජ.ඩො. මිලියන 541 | එ.ජ.ඩො. මිලියන 3,812<br>2019 ජන. - අගෝ. එ.ජ.ඩො. මිලියන 4,855 |
| වෙළඳ භාණ්ඩ අපනයන | එ.ජ.ඩො. මිලියන 947<br>2019 අගෝ. එ.ජ.ඩො. මිලියන 1,033<br>-8.3% වාර්ෂික ලක්ෂ්‍යමය | එ.ජ.ඩො. මිලියන 6,445<br>2019 ජන. - අගෝ. එ.ජ.ඩො. මිලියන 8,030<br>-19.7% වාර්ෂික ලක්ෂ්‍යමය |
| වෙළඳ භාණ්ඩ ආනයන | එ.ජ.ඩො. මිලියන 1,289<br>2019 අගෝ. එ.ජ.ඩො. මිලියන 1,574<br>-18.1% වාර්ෂික ලක්ෂ්‍යමය | එ.ජ.ඩො. මිලියන 10,257<br>2019 ජන. - අගෝ. එ.ජ.ඩො. මිලියන 12,886<br>-20.4% වාර්ෂික ලක්ෂ්‍යමය |

**සංචාරක ඉපැයීම්**
2020 අගෝ.: -
2020 ජන. - අගෝ.: එ.ජ.ඩො. මිලියන 956 (-60.0% වාර්ෂික ලක්ෂ්‍යමය)

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**
2020 අගෝ.: එ.ජ.ඩො. මිලියන 664 (28.2% වාර්ෂික ලක්ෂ්‍යමය)
2020 ජන. - අගෝ.: එ.ජ.ඩො. මිලියන 4,346 (-1.5% වාර්ෂික ලක්ෂ්‍යමය)

**කොළඹ කොටස් වෙළඳපොළ (ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ-ශුද්ධ)**
2020 අගෝ.: එ.ජ.ඩො. මිලියන -44
2020 ජන. - අගෝ.: එ.ජ.ඩො. මිලියන -173

**රාජ්‍ය සුරැකුම්පත් (ශුද්ධ)**
2020 අගෝ.: එ.ජ.ඩො. මිලියන -7
2020 ජන. - අගෝ.: එ.ජ.ඩො. මිලියන -521

**දළ නිල සංචිත**
2020 අගෝ. අග: එ.ජ.ඩො. බිලියන 7.4
(ආනයනික මාස 5.1)

**විනිමය අනුපාතිකය (එ.ජ ඩොලරයට රුපියල්)**
2019 දෙසැ. අග: 181.6340
2020 අගෝ. අග: 186.1578













ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

## සමස්ත නිරීක්ෂණ

2020 වසරේ අගෝස්තු මාසයේ දී වෙළඳ හිඟය අඩු වීම සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල සැලකිය යුතු වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන විවිධ පැතිකඩ ඔස්සේ ශ්‍රී ලංකාවේ විදේශීය අංශය යථා තත්ත්වයට පත් වීම අඛණ්ඩව සිදු විය. වෙළඳ භාණ්ඩ අපනයන ආදායම මාසය තුළ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අඩුවීමක් වාර්තා කළ ද, අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය කිරීම සඳහා පැන වූ නියාමනයන් සහ බොරතෙල් මිල අඩු වීම හේතුවෙන් වෙළඳ භාණ්ඩ ආනයන අඩුවීමත් සමඟ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වෙළඳ හිඟය අඩු විය. කෙසේ වෙතත්, වසංගත බලපෑමට ලක් වූ ගෝලීය ඉල්ලුම හමුවේ වුව ද, අඛණ්ඩව තුන්වන මාසයටත් අපනයන ක්‍රියාකාරිත්වය ශක්තිමත්ව පැවතුණි. මේ අතර, ජංගම ගිණුම ශක්තිමත් කරමින් 2020 වසරේ අගෝස්තු මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සැලකිය යුතු වැඩිවීමක් වාර්තා කළේය. මූල්‍ය ගිණුම සැලකීමේ දී, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශ ආයෝජන ගෙවීම් සුළු ප්‍රමාණයක් වාර්තා වූ අතර, කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් ද විදේශ ආයෝජන ගෙවීම් වාර්තා විය. දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම් වැඩිවීමත් සමඟ දළ නිල සංචිත ගොඩ නැංවීම සඳහා මාසය තුළ දී විදේශ විනිමය අවශෝෂණය  කර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකි විය. අගෝස්තු මැද භාගයේ උච්චාවචනයන් පෙන්නුම් කළ ශ්‍රී ලංකා රුපියල මාසය අවසානයේ දී ස්ථාවර විය.

**සංඛ්‍යා සටහන 1:  විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2019 අගෝ. එ.ජ.ඩො. මිලියන | 2020 අගෝ. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2019 ජන.- අගෝ. එ.ජ.ඩො. මිලියන | 2020 ජන.- අගෝ. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 1,033 | 947 | -8.3 | 8,030 | 6,445 | -19.7 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,574 | 1,289 | -18.1 | 12,886 | 10,257 | -20.4 |
| වෙළඳ ශේෂය | -541 | -342 | | -4,855 | -3,812 | |
| සංචාරක ඉපැයීම් | 271 (ආ) | - | - | 2,389 (ආ) | 956 (ඇ) | -60.0 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 518 | 664 | 28.2 | 4,414 | 4,346 | -1.5 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -12 | -44 | | 22 | -173 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 269 | 114 | | 5,935 | 1,417 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 16 | 1 | | 432 | 91 | |
| දිගුකාලීන ණය | 254 | 113 | | 1,103 | 1,325 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | | 4,400 | - | |
| විදේශ ඍජු ආයෝජන (ඉ) | | | | 535 | 345 | |
| සමස්ත ශේෂය | | | | 1,451 | -722 | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත් වේ.
(ඉ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස හය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි ඍජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ ඍජු ආයෝජන ඇතුළත් වේ.

## වෙළඳ හිඟය හා වෙළඳ මිල අනුපාතය

- **වෙළඳ ගිණුමේ හිඟය** 2019 වසරේ අගෝස්තු මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 541 සිට 2020 වසරේ අගෝස්තු මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 342ක් දක්වා අඩු වූ අතර, මේ සඳහා අපනයන පහළ යෑමේ වේගයට වඩා වැඩි වේගයකින් ආනයන පහත වැටීම හේතු විය. තවද, සමුච්චිත වශයෙන් සැලකීමේ දී, වෙළඳ හිඟය 2019 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 4,855 සිට 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 3,812ක් දක්වා එ.ජ. ඩොලර් බිලියනයකට වඩා වැඩි ප්‍රමාණයකින් අඩු විය. මෙම කාලපරිච්ඡේදය තුළ දී වෙළඳ හිඟය අඩු වීම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූප සටහන 01 මගින් දැක්වේ.
- මේ අතර, අපනයන හා ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන **වෙළඳ මිල අනුපාතය** 2020 වසරේ අගෝස්තු මාසයේ දී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 4.6කින් ඉහළ ගිය අතර, අපනයන මිල ගණන් පහත වැටීමේ වේගයට වඩා වැඩි වේගයකින් ආනයන මිල ගණන් පහත වැටීම මේ සඳහා හේතු විය.

**රූප සටහන 1: 2020 වසරේ ජනවාරි - අගෝස්තු කාලපරිච්ඡේදය තුළ වෙළඳ හිඟය අඩු වීම සඳහා දායක වූ ප්‍රධාන අයිතම : (එ.ජ. ඩො. මිලියන)**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2019 – 2020)**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2019 – 2020)**




**මූලය** : ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

- වර්තමාන ගෝලීය වෙළඳපොළ තත්ත්වයන්ට සාපේක්ෂව සැලකීමේ දී අපනයන ක්‍රියාකාරීත්වය ශක්තිමත් ලෙස පැවතුණද, 2020 වසරේ අගෝස්තු මාසයේ දී **වෙළඳ භාණ්ඩ අපනයන** ආදායම පෙර වසරේ අනුරූප මාසයට මෙන්ම පසුගිය මාසයට සාපේක්ෂව ද පහත වැටුණි. ඒ අනුව, වෙළඳ භාණ්ඩ අපනයන ආදායම 2019 වසරේ අගෝස්තු මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,033ට සහ 2020 වසරේ ජූලි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,085ට සාපේක්ෂව 2020 වසරේ අගොස්තු මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 947ක් දක්වා පහත වැටුණි. පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව අපනයන ආදායම අඩු වීම සඳහා කෘෂිකාර්මික, කාර්මික සහ ඛනිජ අපනයන යන ප්‍රධාන කාණ්ඩ සියල්ලෙහි ම අපනයන ආදායම පහත වැටීම හේතු විය.
- ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා ඇඟලුම්, ඛනිජ තෙල් නිෂ්පාදිත, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් සහ මූල ලෝහ හා උපාංග අපනයනය අඩු වීම හේතුවෙන් 2020 වසරේ අගෝස්තු මාසයේ දී කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 10.2කින් පහත වැටුණි. ප්‍රධාන වශයෙන් ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා වෙළඳපොළ වෙත ඇඟලුම් අපනයනය කිරීම පහත වැටීම හේතුවෙන් 2020 වසරේ අගෝස්තු මාසයේ දී රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම සියයට 11.9කින් පහත වැටුණි. කෙසේ වෙතත්, වෙනත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය යටතේ වර්ග කර ඇති මුහුණු ආවරණ, ආරක්ෂක ඇඳුම් වැනි පෞද්ගලික සනීපාරක්ෂක උපකරණ අපනයන ආදායම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. නැව් සඳහා යොදාගනු ලබන ඉන්ධන අපනයන පරිමාව හා මිල ගණන් පහත වැටීම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම පහත වැටුණි. මේ අතර, ශල්‍ය හා වෛද්‍ය අත්වැසුම් අපනයනය ඉහළ ගිය ද, ටයර් අපනයනය පහත වැටීම හේතුවෙන් රබර් නිෂ්පාදිත අපනයන ආදායම පහත වැටුණි. මීට ප්‍රතිවිරුද්ධව, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් ප්ලාස්ටික් ඇඳුම් උපාංග) සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ (ප්‍රධාන වශයෙන් දියර පොල්කිරි, පොල් ක්‍රීම් සහ පිටි කළ පොල් කිරි වැනි එකතු කළ අගයක් සහිත පොල් නිෂ්පාදිත) උප කාණ්ඩවල අපනයන ආදායම 2020 වසරේ අගෝස්තු මාසයේ දී ඉහළ ගියේය.
- පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව 2020 වසරේ අගෝස්තු මාසයේ දී කෘෂිකාර්මික අපනයන ආදායම සුළු වශයෙන් පහත වැටුණි. කෘෂිකාර්මික අපනයන ආදායම පහත වැටීම සඳහා තේ අපනයනය සියයට 13.3කින් සැලකිය යුතු ලෙස පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, ඊට අමතරව මුහුදු ආහාර සහ රබර් අපනයන පහත වැටීම ද හේතු විය. 2019 වසරේ අගෝස්තු මාසයට සාපේක්ෂව තේ අපනයන මිල ගණන් ඉහළ ගිය ද, අපනයන පරිමාව අඩුවීම හේතුවෙන් තේ අපනයන ආදායම පහත වැටුණි. මෙම උප කාණ්ඩ තුනට අමතරව කෘෂිකාර්මික අපනයන යටතේ වර්ග කර ඇති සියලුම උපකාණ්ඩවල අපනයන ආදායම ඉහළ ගියේය. 2019 වසරේ අගෝස්තු මාසයට සාපේක්ෂව 2020 වසරේ අගොස්තු මාසයේ දී කුරුඳු හා කරාබු නැටි අපනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් කුළුබඩු අපනයන ආදායම ඉහළ ගියේය. පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත සහ පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත අපනයන ඉහළ යෑම හේතුවෙන් පොල් අපනයන ආදායම ඉහළ ගියේය. 2019 වසරේ සැප්තැම්බර් මාසයේ සිට

දක්නට ලැබුණු පුවක් අපනයන ඉහළ යෑමේ ප්‍රවණතාවය අඛණ්ඩව පැවතීම හේතුවෙන් 2019 වසරේ අගෝස්තු මාසයට සාපේක්ෂව 2020 වසරේ අගෝස්තු මාසයේ දී සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය.

- පාෂාණ හා ගල් වර්ග අපනයනය ඉහළ ගියද, ප්‍රධාන වශයෙන් යපස්, යබොර හා අළු අපනයන ආදායම පහත වැටීම හේතුවෙන් පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව 2020 වසරේ අගෝස්තු මාසයේ දී ඛනිජ නිෂ්පාදිත අපනයන ආදායම පහත වැටුණි.
- 2020 වසරේ අගෝස්තු මාසයේ දී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව අපනයන පරිමා දර්ශකය සියයට 3.2කින් ඉහළ ගිය අතර, ඒකක මිල දර්ශකය සියයට 11.2කින් පහත වැටුණි. මෙමගින් පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව 2020 වසරේ අගෝස්තු මාසයේ දී අපනයන පහත වැටීම සඳහා සාමාන්‍යයක් වශයෙන් අපනයන මිල ගණන් පහත වැටීම හේතු විය.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: මාසික අපනයන පරිමා දර්ශකය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| භාණ්ඩය | අගෝ. 2019 (එ.ජ. ඩො. මිලියන) | අගෝ. 2020 (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) | ජන.- අගෝ. 2019 (එ.ජ. ඩො. මිලියන) | ජන.- අගෝ. 2020 (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **812.1** | **729.0** | **-10.2** | **6,330.2** | **4,905.5** | **-22.5** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 33.7 | 40.8 | 21.0 | 303.7 | 302.9 | -0.3 |
| සත්ත්ව ආහාර | 8.1 | 7.7 | -5.1 | 88.8 | 75.6 | -14.9 |
| රෙදිපිළි හා ඇඟලුම් | 499.6 | 440.0 | -11.9 | 3,736.6 | 2,853.1 | -23.6 |
| එයින් ඇඟලුම් | 464.4 | 389.6 | -16.1 | 3,478.5 | 2,528.1 | -27.3 |
| රෙදිපිළි | 26.5 | 22.5 | -14.9 | 187.5 | 154.9 | -17.4 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 8.8 | 28.0 | 218.3 | 70.5 | 170.1 | 141.1 |
| රබර් නිෂ්පාදිත | 72.8 | 71.0 | -2.5 | 591.2 | 488.9 | -17.3 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 24.3 | 12.2 | -49.8 | 199.9 | 102.7 | -48.7 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 32.5 | 31.1 | -4.4 | 275.0 | 209.5 | -23.8 |
| ප්‍රවාහන උපකරණ | 6.0 | 7.1 | 18.5 | 120.5 | 46.2 | -61.6 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 42.6 | 22.0 | -48.4 | 327.5 | 268.1 | -18.1 |
| රසායනික නිෂ්පාදිත | 17.0 | 15.7 | -7.6 | 120.4 | 107.7 | -10.6 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 10.0 | 9.3 | -6.6 | 90.9 | 64.7 | -28.8 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 7.4 | 4.5 | -38.8 | 31.4 | 25.9 | -17.6 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 9.7 | 5.7 | -41.7 | 74.1 | 38.2 | -48.5 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.7 | 23.7 | 255.3 | 49.2 | 72.6 | 47.5 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 13.9 | 10.4 | -24.8 | 120.9 | 76.0 | -37.2 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 2.8 | 1.8 | -36.2 | 19.6 | 13.3 | -32.1 |
| වෙනත් කාර්මික අපනයන | 25.1 | 25.9 | 3.3 | 180.3 | 160.2 | -11.2 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **217.3** | **215.9** | **-0.7** | **1,667.4** | **1,516.0** | **-9.1** |
| තේ | 118.7 | 103.0 | -13.3 | 915.0 | 805.6 | -12.0 |
| රබර් | 1.7 | 1.5 | -13.2 | 18.6 | 17.9 | -4.2 |
| පොල් | 28.1 | 33.9 | 20.9 | 232.1 | 221.5 | -4.6 |
| කුළුබඩු | 33.3 | 39.7 | 19.2 | 203.4 | 194.5 | -4.4 |
| එළවළු | 2.7 | 5.2 | 88.5 | 21.2 | 26.1 | 23.4 |
| සකස් නොකළ දුම්කොළ | 3.3 | 4.9 | 50.2 | 22.7 | 16.9 | -25.2 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 8.9 | 12.1 | 35.3 | 70.0 | 100.3 | 43.2 |
| මුහුදු ආහාර | 20.5 | 15.6 | -24.0 | 184.5 | 133.2 | -27.8 |
| **3. ඛනිජමය අපනයන** | **1.9** | **1.6** | **-14.1** | **21.3** | **14.3** | **-33.1** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.2** | **0.8** | **-37.4** | **11.3** | **9.3** | **-17.3** |
| **මුළු අපනයන** | **1,032.5** | **947.2** | **-8.3** | **8,030.2** | **6,445.0** | **-19.7** |

(අ) තාවකාලික

***මූලයන්:*** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

- 2020 වසරේ මාර්තු මාසයේ සිට පැවති වෙළඳ භාණ්ඩ ආනයන වියදම පහත වැටීමේ ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින් 2020 වසරේ අගෝස්තු මාසයේ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,289ක් දක්වා සියයට 18.1කින් පහත වැටුණි. තෝරාගත් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සීමා කිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඉන්ධන මිල ගණන් පහත වැටීම ආනයන වියදම පහත වැටීම සඳහා මූලික වශයෙන් හේතු විය.
- ආහාර හා පාන වර්ග සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ යන කාණ්ඩ දෙකෙහි ම ආනයන පහත වැටීම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. විදුලි සන්දේශ මෙවලම් (ප්‍රධාන වශයෙන් ජංගම දුරකථන) හැර අනෙකුත් සියලුම උපකාණ්ඩ ආනයන පහත වැටීම හේතුවෙන් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. 2020 වසරේ අගෝස්තු මාසයේ දී පෞද්ගලික භාවිතය සඳහා ගනු ලබන රථවාහන ආනයන වියදම සියයට 98.4කින් කැපී පෙනෙන ලෙස අඩුවිය. විශේෂයෙන්ම කිරි ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් කිරිපිටි), එළවළු (ප්‍රධාන වශයෙන් ලොකු ළූණු), මුහුදු ආහාර (ප්‍රධාන වශයෙන් ටින් කළ මාළු), පලතුරු (ප්‍රධාන වශයෙන් ඇපල් හා මිදි) සහ පාන වර්ග (ප්‍රධාන වශයෙන් මත්පැන්) ආනයනය පහත වැටීම හේතුවෙන් 2020 වසරේ අගෝස්තු මාසයේ දී ආහාර හා පාන වර්ග ආනයන වියදම පහත වැටුණි. කෙසේ වෙතත්, 2019 වසරේ අගෝස්තු මාසයට සාපේක්ෂව 2020 වසරේ අගෝස්තු මාසයේ දී තෙල් වර්ග හා මේද (ප්‍රධාන වශයෙන් පොල්තෙල්), කුළුබඩු (ප්‍රධාන වශයෙන් මිරිස්), සීනි සහ ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් මෝල්ට්) ආනයන වියදම ඉහළ ගියේය.
- 2020 වසරේ අගෝස්තු මාසයේදී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව අන්තර් භාණ්ඩ ආනයන වියදම පහත වැටුණු අතර, ඒ සඳහා රෙදිපිළි හා රෙදිපිළි උපාංග (සියයට -16.7), ඉන්ධන (සියයට -5.2) සහ පොහොර (සියයට -74.4) ඇතුළුව බොහෝ උපකාණ්ඩවල ආනයනය පහත වැටීම හේතු විය. 2019 වසරේ අගෝස්තු මාසයට සාපේක්ෂව 2020 වසරේ අගෝස්තු මාසයේ දී බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන පරිමාව ඉහළ ගිය ද, ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඉන්ධන මිල ගණන් පහත වැටීම හේතුවෙන් ඉන්ධන ආනයන වියදම පහත වැටුණි. බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයන මිල 2019 වසරේ අගෝස්තු මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් 64.78ට සාපේක්ෂව 2020 වසරේ අගෝස්තු මාසයේ දී එ.ජ.ඩොලර් 47.74ක් දක්වා පහත වැටුණි. මේ අතර, ප්‍රධාන වශයෙන් රෙදි වර්ග, කෙඳි වර්ග හා නූල් වර්ග ආනයනය පහත වැටීම හේතුවෙන් රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම පහත වැටුණි. තවද, 2019 වසරේ අගෝස්තු මාසයට සාපේක්ෂව 2020 වසරේ අගෝස්තු මාසයේ දී තිරිඟු හා ඉරිඟු, ආහාර සැකසුම්, කෘෂිකාර්මික යෙදවුම්, ඛනිජ නිෂ්පාදිත සහ සකස් නොකළ දුම්කොළ හැර අන්තර් භාණ්ඩ යටතේ වර්ගකර ඇති සියලුම උපකාණ්ඩවල ආනයන වියදම පහත වැටුණි.
- පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියලුම උප කාණ්ඩවල ආනයන පහත වැටීමේ හේතුවෙන් 2020 වසරේ අගෝස්තු මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම කැපී පෙනෙන

ලෙස පහත වැටුණි. මේ අනුව, 2019 වසරේ අගෝස්තු මාසයට සාපේක්ෂව 2020 වසරේ අගෝස්තු මාසයේදී යන්ත්‍රසූත්‍ර හා උපකරණ (ප්‍රධාන වශයෙන් විදුලි සන්දේශ මෙවලම්), ගොඩනැගිලි ද්‍රව්‍ය (ප්‍රධාන වශයෙන් යකඩ හා වානේ හා ඒ ආශ්‍රිත උපාංග සහ සිමෙන්ති) සහ ප්‍රවාහන උපකරණ (ප්‍රධාන වශයෙන් ත්‍රීරෝද රථ, ටැංකි හා බවුසර් වැනි වාණිජ කටයුතු සඳහා භාවිතා කරනු ලබන රථවාහන) ආනයන වියදම පහත වැටුණි.

- 2020 වසරේ අගෝස්තු මාසයේදී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ආනයන පරිමා දර්ශකය සහ මිල දර්ශකය යන දර්ශක දෙකම පිළිවෙලින් සියයට 3.6කින් සහ සියයට 15.1කින් පහත වැටුණු අතර, මෙමගින් 2020 වසරේ අගෝස්තු මාසයේ දී ආනයන වියදම පහත වැටීම සඳහා ආනයන පරිමාව මෙන්ම ආනයන මිල ගණන් යන සාධක දෙකෙහි ම පහත වැටීම හේතු වූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 6: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: මාසික ආනයන පරිමා දර්ශකය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)**

| කාණ්ඩය | අගෝ. 2019 (එ.ජ. ඩො. මිලියන) | අගෝ. 2020 (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) | ජන.- අගෝ. 2019 (එ.ජ. ඩො. මිලියන) | ජන.- අගෝ. 2020 (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **332.1** | **228.6** | **-31.2** | **2,499.2** | **2,300.3** | **-8.0** |
| ආහාර හා පාන වර්ග | 117.9 | 106.1 | -10.0 | 917.1 | 1,023.7 | 11.6 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.9 | 3.0 | 3.4 | 22.2 | 21.0 | -5.3 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 38.0 | 23.0 | -39.4 | 216.1 | 228.9 | 5.9 |
| එළවළු (ආ) | 22.5 | 18.4 | -18.3 | 187.6 | 246.3 | 31.3 |
| මුහුදු ආහාර | 18.0 | 12.7 | -29.8 | 145.8 | 139.5 | -4.3 |
| සීනි හා රසකැවිලි | 13.0 | 18.5 | 42.0 | 126.4 | 162.6 | 28.6 |
| කුළුබඩු | 6.7 | 8.0 | 19.1 | 68.1 | 84.2 | 23.6 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 16.8 | 22.6 | 34.6 | 151.0 | 141.2 | -6.5 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 214.2 | 122.5 | -42.8 | 1,582.0 | 1,276.7 | -19.3 |
| පෞද්ගලික රථවාහන | 76.7 | 1.3 | -98.4 | 496.4 | 280.8 | -43.4 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 50.9 | 47.6 | -6.4 | 350.5 | 385.3 | 9.9 |
| ගෘහ මෙවලම් | 17.6 | 8.6 | -51.1 | 131.3 | 100.4 | -23.5 |
| රෙදිපිළි හා උපාංග | 18.4 | 13.2 | -28.2 | 174.5 | 137.6 | -21.1 |
| විදුලි සංදේශ මෙවලම් | 16.0 | 27.6 | 72.6 | 157.2 | 174.6 | 11.1 |
| ගෘහ හා දැව භාණ්ඩ | 14.0 | 10.4 | -25.6 | 104.7 | 91.6 | -12.5 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 20.4 | 13.7 | -33.1 | 167.6 | 106.4 | -36.5 |
| **2. අන්තර් භාණ්ඩ** | **863.8** | **791.3** | **-8.4** | **7,379.8** | **5,692.4** | **-22.9** |
| ඉන්ධන | 261.2 | 247.5 | -5.2 | 2,576.8 | 1,691.2 | -34.4 |
| එයින් බොරතෙල් | 45.3 | 69.3 | 52.8 | 630.8 | 387.6 | -38.5 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 215.8 | 178.2 | -17.4 | 1,820.7 | 1,174.4 | -35.5 |
| ගල්අඟුරු | 0.1 | 0.0 | -33.3 | 125.3 | 129.2 | 3.1 |
| දියමන්ති හා අගනා ගල් වර්ග | 8.9 | 7.9 | -11.2 | 118.4 | 57.4 | -51.5 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 233.5 | 194.4 | -16.7 | 1,876.9 | 1,457.2 | -22.4 |
| කඩදාසි හා ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 42.0 | 30.5 | -27.3 | 295.5 | 239.5 | -19.0 |
| කෘෂිකාර්මික යෙදවුම් | 13.3 | 14.6 | 10.0 | 127.1 | 132.5 | 4.3 |
| තිරිඟු හා ඉරිඟු | 24.9 | 46.0 | 84.9 | 203.4 | 229.3 | 12.7 |
| මූල ලෝහ | 41.5 | 39.0 | -6.2 | 366.2 | 246.6 | -32.7 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 50.0 | 48.9 | -2.1 | 394.9 | 323.9 | -18.0 |
| රසායනික නිෂ්පාදිත | 66.8 | 65.3 | -2.3 | 553.5 | 518.3 | -6.4 |
| පොහොර | 32.2 | 8.2 | -74.4 | 137.5 | 124.3 | -9.6 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 22.3 | 17.0 | -23.9 | 152.3 | 145.8 | -4.3 |
| ඛනිජ නිෂ්පාදිත | 11.3 | 14.3 | 26.4 | 137.0 | 107.6 | -21.5 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 55.9 | 57.5 | 2.8 | 440.2 | 418.7 | -4.9 |
| **3. ආයෝජන භාණ්ඩ** | **376.3** | **269.0** | **-28.5** | **3,001.8** | **2,253.2** | **-24.9** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 184.4 | 177.6 | -3.7 | 1,610.2 | 1,324.6 | -17.7 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 132.6 | 82.0 | -38.2 | 1,006.9 | 671.4 | -33.3 |
| ප්‍රවාහන උපකරණ | 58.9 | 9.1 | -84.5 | 380.2 | 255.3 | -32.8 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.4 | 0.2 | -45.3 | 4.5 | 2.0 | -56.5 |
| **4. වර්ග නොකළ ආනයන** | **1.4** | **0.2** | **-87.3** | **4.8** | **11.4** | **136.9** |
| **මුළු ආනයන** | **1,573.6** | **1,289.1** | **-18.1** | **12,885.5** | **10,257.4** | **-20.4** |
| **ඉන්ධන නොවන ආනයන** | **1,312.4** | **1,041.6** | **-20.6** | **10,308.8** | **8,566.1** | **-16.9** |

(අ) තාවකාලික

(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

**මූලයන් :** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

- කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සංචාරකයින් රට තුළට පැමිණීම වැළැක්වීම සඳහා සියළුම ගුවන්තොටුපළ සහ වරායන් වසා තැබීම හේතුවෙන් අඛණ්ඩව පස්වන මාසයටත් 2020 වසරේ අගෝස්තු මාසයේ දී **සංචාරක පැමිණීම්** කිසිවක් වාර්තා නොවීය. එමනිසා, 2019 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ දී පැමිණි 1,267,737ක සංචාරකයින් ප්‍රමාණය හා සැසඳීමේ දී 2020 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ සමුච්චිත සංචාරක පැමිණීම් ප්‍රමාණය 507,311ක් ලෙස පැවතුණි. ඒ අනුව, සංචාරකයින්ගේ පැමිණීම මත පදනම්ව ඇස්තමේන්තු කෙරෙන **සංචාරක ඉපැයීම්** 2020 වසරේ අගෝස්තු මාසය දක්වා වූ කාලය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 956 ක් වූ අතර, එය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 60.0ක අඩුවීමකි.
- මේ අතර, 2020 වසරේ අගෝස්තු මාසයේ දී **විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ** අඛණ්ඩව තුන්වන මාසයටත් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 28.2ක වර්ධනයක් වාර්තා කරමින් එ.ජ. ඩොලර් මිලියන 664ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මෙම වැඩිවීම, 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා වූ කාලසීමාවේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 4,346ක් දක්වා ඉහළ යෑමටත්, 2019 වසරේ අදාළ කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සමුච්චිත ප්‍රේෂණ ප්‍රමාණයෙහි අඩුවීම සියයට 1.5ක් දක්වා සීමා වීමටත් උපකාරී විය.

**රූප සටහන 8: මාසික සංචාරක පැමිණීම්**




**මූලය**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**




**මූලයන්**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්

- 2020 වසරේ අගෝස්තු මාසයේ දී රුපියල්වලින් නාමනය කරන ලද **රාජ්‍ය සුරැකුම්පත්** වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 7ක විදේශීය ආයෝජනවල සුළු ශුද්ධ ගෙවීමක් වාර්තා වීම හේතුවෙන්, සමුච්චිත පදනම මත, 2020 වසරේ ජනවාරි-අගෝස්තු දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 521ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය. රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ආයෝජන ප්‍රමාණය 2020 වසරේ අගෝස්තු මාසය අවසන් වන විට එ.ජ. ඩොලර් මිලියන 63ක් ලෙස ඉතා අඩු මට්ටමක පැවතුණි.
- 2020 වසරේ අගෝස්තු මාසයේ දී **කොළඹ කොටස් වෙළඳපොළෙහි** ද්විතීයික වෙළඳපොළ තුළින් එ.ජ. ඩොලර් මිලියන 44ක ශුද්ධ ගෙවීම් වාර්තා විය. මාසය තුළ දී ප්‍රාථමික වෙළඳපොළ වෙත ලැබීම් වාර්තා නොවීය. සමුච්චිත පදනම මත, 2020 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ තුළින් එ.ජ. ඩොලර් මිලියන 173ක ශුද්ධ ගෙවීමක් (ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ දෙකම ඇතුළත්ව) වාර්තා කළේය.
- මේ අතර, 2020 වසරේ අගෝස්තු මාසයේ දී රජය වෙතවූ **දිගු කාලීන ණය** එ.ජ. ඩොලර් මිලියන 50ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

## ජාත්‍යන්තර සංචිත

- 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 7.4ක් වූ අතර, එය ආනයනික මාස 5.1කට සමාන විය. දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2020 වසරේ අගෝස්තු මාසය අවසානය වන විට මාස 7.2ක ආනයන ආවරණය කෙරෙන පරිදි එ.ජ. ඩොලර් බිලියන 10.3ක් විය.

**රූප සටහන 10: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

- 2020 වසරේ අප්‍රේල් මස මැද භාගයේ සිට අඛණ්ඩව අතිප්‍රමාණය වූ ශ්‍රී ලංකා රුපියල, 2020 අගෝස්තු මාසය මැද දී යම් උච්චාවචනයන් පෙන්නුම් කිරීමෙන් අනතුරුව මාසය තුළ දී සියයට 0.3ක සුළු අවප්‍රමාණය වීමක් වාර්තා කළේය. 2020 වසර ආරම්භයේ සිට ඔක්තෝබර් 09 වැනි දින දක්වා වූ කාලය තුළ දී එ.ජ. ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියලෙහි සමස්ත අවප්‍රමාණය වීම සියයට 1.4ක් විය. දළ නිල සංචිත ඉහළ නංවා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අඛණ්ඩව දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වීම් සිදු කරන ලදී. 2020 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් මිලියන 255.1ක් අවශෝෂණය කර ගන්නා ලදී. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් 2020 වසර ආරම්භයේ සිට ඔක්තෝබර් මස 09 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල, යූරෝ, ස්ටර්ලින් පවුම, ජපන් යෙන් සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය වූ අතර, ඉන්දියානු රුපියලට සාපේක්ෂව අතිප්‍රමාණය විය.

**රූප සටහන 11: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2018 | 2019 | 2020 (ඔක්. 09 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -16.4% | +0.6% | -1.4% |
| යූරෝ | -12.7% | +2.6% | -6.1% |
| ස්ටර්ලින් පවුම | -11.4% | -2.8% | -0.1% |
| ජපන් යෙන් | -18.1% | -1.0% | -3.9% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -7.6% | +1.3% | -3.8% |
| ඉන්දියානු රුපියල | -8.7% | +2.6% | +1.3% |

**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව